# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2085/9 – 2018 අගෝස්තු 21 වැනි අඟහරුවාදා – 2018.08.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය*: IR/22/02/2014.

### කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය

අංක 2065/34 දරන හා 2018.04.05 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශවයක් වශයෙන් දඹදෙණිය, වැත්තෑව, වැත්තෑව පාසල ඉදිරිපිට පදිංචි ඩී. එස්. එම්. විජේසිංහ මයා හා අනෙක් පාර්ශවය වශයෙන් මහනුවර, යටිනුවර වීදිය, අංක 106 හි පිහිටි කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 3671 දරන හා 2017.12.19 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ඩී. එස්. එම්. විජේසිංහ මයා වෙතින් කාර්මික ආරවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 3671 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2019.04.05 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,  
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 අගෝස්තු මස 13 වැනි දින,  
කොළඹ 05,  
කම්කරු දෙපාර්තමේන්තුව.


1A – G28328 – 09 (2018/08)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පළමුවන උපලේඛනය
''අ'' ආකෘති පත්‍රය

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**
**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : ඩී. එස්. එම්. විජේසිංහ
වැත්තෑව පාසල ඉදිරිපිට,
වැත්තෑව,
දඹදෙණිය.

දිනය : 2018 ජූලි මස 10 වැනි දින.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය.

2018.04.05 දිනැති අංක 2065/34 දරන *ගැසට්* පත්‍රයේ පළකරන ලද්දා වූ ද ඩී. එස්. එම්. විජේසිංහ ඉල්ලුම්කරු සහ කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ලිමිටඩ් වගඋත්තරකරු බැඳී සිටින්නා වූ ද 2017.12.19 (A 3671)

දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අත්සන (ඉල්ලුම්කරු)

පිටපත (අනෙක් පාර්ශවය) කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ලිමිටඩ්, අංක 106, යටිනුවර වීදිය, මහනුවර, ලියාපදිංචි රිසිට්පත අමුණා ඇත.

1) ප්‍රතික්ෂේප කරන පාර්ශවය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශවයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්තිය බලන්න).

2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශවයක් සේවායෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශවයක්, සේවායෝජකයකු වෘත්තීය සමිතියක් හෝ සේවකයකු වෙනුවෙන් ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතුය.

09-72

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.